# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1861/35 - 2014 මැයි මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2014.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/14/02/2007.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.07.27 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ බදුල්ල, හිඳගොඩ, හංවැල්ල, කුට්ටියගොල්ල පාර, අංක 26/14 හි පදිංචි එච්. එන්. එච්. හෙන්නායක මිය සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3398 දරන ප්‍රදානය 2013.10.17 දිනැති හා අංක 1832/33 දරන රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබාදී ඇති 2014.04.04 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18 (1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 අප්‍රේල් මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR//14/02/2007.

එක් පාර්ශවයක් වශයෙන්,

එච්. එන්. එච්. හෙන්නායක මිය,
අංක 26/14, කුට්ටියගොල්ල පාර,
හංවැල්ල, හිඳගොඩ,
බදුල්ල.

අනෙක් පාර්ශවය වශයෙන්

නඩු අංකය : ඒ/3398

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධවයි.

කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) ගේ 2014.04.01 වෙනි දින දරන ලිපිය ප්‍රකාර අර්ථ නිරූපනය පහත සඳහන් කරමි.

2013.10.17 වෙනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද එච්. එන්. එච්. හෙන්නායක මිය එදිරිව ලංකා විදුලිබල මණ්ඩලය යන බේරුම්කරණ නීති කෘතියේ ඉල්ලුම්කාරිය සඳහා 2013.09.03 වෙනි දින දෙන ලද ප්‍රදානය ක්‍රියාත්මක කළ යුතු දිනය ලෙස ගැසට් පත්‍රයේ පළ වී දෙමසක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු බවට මම අර්ථ නිරූපනය කොට මෙයින් ඉදිරිපත් කරමි.

පාලිත වීරසේකර,
බේරුම්කරු.

2014 අප්‍රේල් මස 04 වැනි දින.

05 - 709


1 A – G 19539 — 75 (2014/05)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය : IR/10/40/2010.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.06.09 දිනැති හා අංක 1709/46 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.05.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මුල්ලේරියාව නව නගරය, කොටිකාවත්ත, නො. 103හි පදිංචි එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණිකේ හේරත් මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රොලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.02.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2014 අප්‍රේල් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR//10/40/2010.

කාර්මික අධිකරණයේ දී ය.

එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණිකේ
හේරත් මිය,
නො. 103, කොටිකාවත්ත,
මුල්ලේරියාව නව නගරය.

පළමු පාර්ශවය

නඩු අංකය : A 3378

සහ

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ්
ටර්මිනල්ස් ලිමිටඩ්,
නිමාව,
කොලොන්නාව.

දෙවන පාර්ශවය
අතර පවතින ආරාවුල.

ප්‍රදානය

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා කම්කර සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2011.05.26 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**ආරවුලට හේතු වී ඇති කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

"සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් A - 7 ශ්‍රේණියේ විධායක සහකාර (ලේඛක) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම මගින් උසස්වීම් ලබා දීමේ දී ඒ සඳයහා පෙනී සිටි B "අධි" ශ්‍රේණියේ ලඝු ලේඛිකා (සිංහල) එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණිකේ හේරත් මහත්මියට එම උසස්වීම ලබා නොදීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඇයට කුමන සහනයක් හිමි ද යන්න" ය.

**පෙනී සිටීම**

මෙම නඩුවේ පළමුවැනි පාර්ශ්වය ලෙස තමාට අසාධාරණයක් සිදුවී යයි පවසමින් සහනයක් පතන එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණියේ හේරත් මහත්මිය නඩු කටයුත්ත පුරා ම ඊට සහභාගි විය. ආරම්භයේ දී මූලික ප්‍රකාශය සහ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ පටන් 2012.05.23 වන දින තෙක් නඩුවාර නවයක දී පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියේ නියෝජිත එච්. ඒ. විල්බට් පෙරේරා මහතා ය. මේ වකවානුව තුළ විල්බට් පෙරේරා මහතා මිය ගිය බැවින් පළමුවැනි පාර්ශ්වයේ නියෝජිත වශයෙන් 2012.07.28 දින සිට බලපැවැත්වෙන සේ ජී. ඩබ්ලිව්. ශ්‍රේෂන් පෙරේරා මහතා පත්කරනු ලැබ නඩුව අවසන් වන තුරු ඔහු විසින් එකී කාර්යය ඉටුකරන ලදී.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ මානව සම්පත් සහකාර පී. ඩී. විජේවර්ධන මහතාත්, උසාවි ලිපිකරු සරත් කරුණාරත්න මහතාත්, ඒ. එස්. ජේ. පෙරේරා මහතාත් වරින් වර පෙනී සිට ඇත. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නඩුව පුරාවට ම පෙනී සිටියේ නීතිඥ එල්. ඩබ්ලිව්. ගුණසේකර මහතා ය.

**නඩු පටිපාටිය**

මෙම නඩුව 2011.08.25 දින පළමු වතාවට කැඳවනු ලැබුණි. පළමු සහ දෙවැනි ප්‍රකාශයන් පාර්ශ්වයන් දෙකට ම හුවමාරු කර භාරදෙනු ලැබ, ඒවා ද සැලකිල්ලට ගෙන විභාගයකට අවතීර්ණ නොවී දෙපාර්ශ්වයේ එකඟතාව මත කිසියම් සාධාරන සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශ්වය ගෙන ඒම අපහසුවූයෙන් විභාගය ඇරඹුණි. නඩුව වාර 24කට කැඳවන ලදී.

පළමුවැනි පාර්ශ්වය වශයෙන් මෙම ප්‍රදානයේ සඳහන් වන සහනයක් ඉල්ලන සඳසීලි මැණිකේ හේරත් මහත්මියත්, කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරිනී ඩී. එම්. ටී. ඩී. දසනායක මහත්මියත්, කම්කරු නිලධාරී ඒ. ජී. අනුෂ් ලසන්ත පියසේන මහතාත් සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබුණි.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ නියෝජ්‍ය මානව සම්පත් කළමණාකරු කාලිංග මුදලිගේ නීල් අසංක චන්ද්‍රනාත් පෙරේරා මහතාත්, කම්කරු දෙපාර්තමේන්තුවේ මැද කොළඹ කම්කරු කොමසාරිස් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරී එම්. එම්. රාසික් මහතාත්, කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශයේ කම්කරු නිලධාරී අනුෂ් ලසන්ත පියසේන මහතාත් සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබිණි.

පළමුවන පාර්ශවය විසින් A 1 සිට A 30 දක්වා ලේඛනත්, දෙවැනි පාර්ශවය විසින් R 1 සිට R 16 දක්වා ලේඛනත් ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

දෙපාර්ශවය විසින් ම නිල සාක්ෂිකරුවන් වශයෙන් සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබූ කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන් සාක්ෂි ලබා දුන්නේ අංක IR 1/10/40/2010, CC/10/0/658/2009 සහ CC/10/0/51/2009 යන ලිපිගොනු ආශ්‍රයෙන් ය.

**පාර්ශ්වයන් ගොඩනැගූ ස්ථාවරයන්**

පළමුවන පාර්ශ්වය ආරම්භයේ සිට ම ගොඩනගන්නට වෑයම් කළ ස්ථාවරය වූයේ සහනයන් ඉල්ලා සිටින සඳසීලි මැණිකේ හේරත් මහත්මියට ලැබිය යුතු වූ සේවා උසස්වීමක් නිසි කලට නොලැබීමෙන් ඇයට අසාධාරණයක් වූ බවයි.

අනෙක් අතට දෙවන පාර්ශ්වය, පළමුවැනි පාර්ශ්වයේ එකී ස්ථාවරයන් බිඳහෙළීමට උත්සාහ කරමින් කියා සිටියේ සඳසීලි හේරත් මහත්මියට ඇයගේ වර්තමාන සේව්‍යයා වන සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයෙන් ලබා දිය හැකි උසස්වීම් ලබා දී ඇති බැවින් ඇයට කිසිදු අසාධාරණයක් සිදු වී නොමැති බවයි.

**නිරීක්ෂණ**

- එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණිකේ හේරත් මහත්මිය 1982.10.01 දින නිසි ලෙස සුදුසුකම් සම්පූර්ණ කොට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ B 4 ශ්‍රේණියේ සිංහල/ඉංග්‍රීසි ලඝු/යතුරු ලේඛක තනතුරකට පත්කරනු ලැබ ඇත.

- ඒ ඒ අවස්ථාවල පැවැත්වූ තරග විභාග වලින් සමත් වීමෙන් පසු සහ නියමිත උසස්කිරීමේ පටිපාටි වලට අනුව ඇය

  B 3 ශ්‍රේණියට 1985.03.01 දින සිටත් (A 6)
  B 2 ශ්‍රේණියට 1995.08.15 දින සිටත් (A 10)
  B 1 ශ්‍රේණියට 2001.04.15 දින සිටත් (A 11)

  උසස් කරනු ලැබ ඇත.

- B 1 ශ්‍රේණිය දක්වා ලැබූ සියලු උසස්වීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විධායක නොවන ශ්‍රේණි වලට අයත් ඒවා ය.

- එම ආයතනයේ විධායක ශ්‍රේණියට අදාළ වන A 7 ශ්‍රේණියේ විධායක සහකාර (ලේඛක) තනතුරු සඳහා බඳවාගනු පිණිස 2013.03.12 දින එහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) විසින් අයදුම්පත් කැඳවන ලදී. (A 12)

- තමාට නිසි සුදුසුකම් තිබුණු හෙයින් එකී තනතුරු සඳහා ඉල්ලුම් කිරීමෙන් පසු ව 2003.10.28 දින සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරන ලදී. (A 13 ලේඛනය සහ 2012.04.20 දින සටහන් වූ පිටු 5 සහ 6)

- එකී සම්මුඛ පරීක්ෂණයට ඇය සමග 7 - 8 දෙනෙකු පෙනී සිට ඇත. (2012.04.20 දින සටහන් පිටුව 7)

- එම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි තමාට වඩා අඩු සුදුසුකම් තිබුණු කීප දෙනෙකුට ම A 7 ශ්‍රේණියට උසස්වීම් ලැබුණු බවත්, තමාට අසාධාරණ ලෙස ඒ අවස්ථාවේ දී පත්වීම ලබානොදුන් බවත් පෙන්වාදීමට පළමුවැනි පාර්ශ්වය උත්සාහ දරා ඇත. (2012.04.20 දින 7 සහ 11 පිටු)

  එදින සටහන් පිටු 8හි

  "ප්‍ර : තමාට වඩා අඩු සුදුසුකම් තිබුණු අය සිටියා ද ?

  උ : ඔව්.

  ප්‍ර : විභාග ප්‍රතිඵල ලේඛනය බැලුවොත් කියන්න පුළුවන් ද තමන් කියන කාරණය සත්‍ය බව ඔප්පු වෙනවා කියලා ?

  උ : ඔව්.

  ප්‍ර : 2003 ඔක්තෝබර් 28 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලේඛනය කාගේ භාරයේ ද තිබෙන්නේ ?

  උ : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ.

  ප්‍ර : එම ලේඛනය මෝසම් පත්‍රයක් මගින් මෙම ගරු අධිකරණයේ අවසරය ඇතිව ගරු අධිකරණයට කැඳවන්න තබා බලාපොරොත්තු වෙනවා ද ?

  උ : ඔව්"

  එබඳු ලකුණු ලේඛනයක් කිසිදු පාර්ශ්වයකින් ඉදිරිපත් කිරීමක් සිදුවුනේ නැත. කෙසේ වුවත් B 3, B 2, B 1 උසස්කිරීම් වලදී අනෙක් ඉල්ලුම්කරුවන්ට සාපේක්ෂව තමාට ඉහළ ලකුණු තිබුණු බව ඔප්පු කිරීමට ලේඛන කීපයක් පළමුවැනි පාර්ශ්වයෙන් ලකුණු කොට ඉදිරිපත් කෙරුණි.

- දෙවන පාර්ශ්වයෙන් මේ සම්බන්ධයෙන් තහවුරු කිරීමට උත්සාහ ගනු ලැබුවේ සම්මුඛ පරීක්ෂනයට පෙනී සිටියත් සඳසීලි මහත්මිය එකී සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වී නැති බවයි. දෙවන පාර්ශ්වයේ ලිඛිත සැලකිරීම් වල 5 වන පිටුවේ 5 ඡේදයෙන් ඒ බව පැහැදිලි වේ.

  "නමුත් මෙහිදී 2003 වර්ෂයේ පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයට පැමැණිලිකාරිය ඉදිරිපත් වුවත් ඇය තෝරා ගෙන නැත. එකී තෝරා නොගැනීම මත ඇයට යම් අසාධාරණයක් වූයේ ද යන්න පිළිබඳ ව කම්කරු දෙපාර්තමේන්තුවේ දී කිසිදු පරීක්ෂණයක් පැවැත්වී නැත. කාර්මික අධිකරණයේදී ද 2003 වර්ෂයේ ලංකා ඛනිජ

තෙල් නීතිගත සංස්ථාවේ සම්මුඛ පරීක්ෂණය මගින් පැමිණිලිකාරිය තෝරා නොගැනීමෙන් ඇයට අසාධාරණයක් වූයේ කෙසේ ද? ඇයට වඩා අඩු සුදුසුකම් හා පළපුරුද්ද ඇති අය තෝරා ගත්තේ ද? එසේ නම් ඒ කවුද යන්න පිළිබඳ කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වූයේ නැත.”

- සියලු සුදුසුකම් තිබිය දී තමාට උසස්වීම නොදීම සහ තමාට වඩා අඩු සුදුසුකම් ඇති අයට උසස්වීම ලබාදීම පිළිබඳව ඇය දිගින් දිගට ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලනාධිකාරියටත්, බාහිර පාර්ශව වලටත් පැමිණිලි කොට ඇත. (A 16, A 17, A 18, A 19, A 20, A 22, A 23, A 24)

- ඒ කිසිවකින් ඇයට ප්‍රතිඵලයක් ලැබී නැති බැවින් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් නමැති ආයතනයෙන් එයට සාධාරණය ඉටු විය යුතු බව පළමුවැනි පාර්ශ්වයේ ස්ථාවරයයි.

- මේ අතරතුර 2013.10.13 දිනැති අංක : 1310/8 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් ගබඩා කිරීමේ ස්ථානය හා බෙදාහැරීමේ ස්ථානය ඒකාබද්ධ කොට පට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් නමැති ආයතනය බිහි කෙරුණි. (R 01 ලේඛනය හා 2012.05.23 දිනැති සටහන් පත්‍රිකා පිටු 10).

- සඳසීලි හේරත් මහත්මිය ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ සිට අළුතෙන් නිර්මාණය කරන ලද (ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස) සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් වෙත පත් කෙරුනි. නව ආයතනයෙන් ඇයට නව පත්වීමේ ලිපියක් ලබා දී නැත. (පළමුවැනි පාර්ශ්වයේ ලිඛිත සැළකිරීම් 2 පිටුව)

- ඇය වෙත වැටුප් ගෙවීමේ දී නිකුත් කරන මාසික වැටුප් පත්‍රිකාව මේ වන විටත් නිකුත් කරනු ලබන්නේ ද ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව භාවිතා කරන එහි ලිපි අකෘතිය වේ. 2012 මාර්තු මාසය සඳහා ඇය වෙත නිකුත් කළ සේවක වැටුප් පත්‍රිකාවෙන් (A 26) ඒ බව සනාථ කෙරුණි.

- අංක : 1310/8 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* සේවකයින් සම්බන්ධ බැඳීම් පිළිබඳව ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ සභාපති විසින් කරන ලද විමසුම් වලට නීතිපතිතුමා කර ඇති පැහැදිලි කිරීම් (A $29_A$ , A $30_A$) වලින් මතයක් පළ කරමින් කියා සිටින්නේ, අදාළ දින (එනම් 2003.10.13) දින වන විට ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ වගකීම් ලංකා පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය විසින් දැරිය යුතු බවයි.

දෙවන පාර්ශ්වය උත්සාහ කළේ එය හුදු මතයක් බවත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට කරන ලද නියෝගයක් නොවන බවයි.

- මුල් අවස්ථාවේ දී මෙම ආයතන දෙකෙහිම සභාපතිවරයා ලෙස සිටියේ එක් අයෙකු බව ද හෙළි විය.

- දිගින් දිගටම දෙවැනි පාර්ශ්වයෙන් ගොඩනැගූ ස්ථාවරයක් වී තිබෙන්නේ සඳසීලි මහත්මිය 2003.10.28 දින මුහුණදුන් සම්මුඛ පරීක්ෂණය ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ දී පැවැත්වූ එකක් බවත් එහිදී තීරණය නොවුණු තනතුරු උසස්වීමක් පිළිබඳව ලංකා පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් මගින් සලකාබැලිය නොහැකි බවත්, එසේ වීමට ප්‍රධාන හේතුව ඒ පැහැදිලි ව ම වෙන්වූ ආයතන දෙකක් ලෙස සැලකිය යුතු නිසා බවත් ය.

- අනෙක් අතට සඳසීලි මහත්මිය ලංකා පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය මගින් 1009.11.25 දී පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵලයක් ලෙස 2010.11.02 දින සිට මෙම නඩුවට ප්‍රස්තුත වන විධායක සහකාර ලේඛක (සිංහල) තනතුරට උසස් කරනු ලැබ පසු ව එය 2009.12.01 දිනට පෙරදාතම කරනු ලැබ ඇත.

- ඒ අනුව දෙවැනි පාර්ශවය කියා සිටින්නේ සඳසීලි මහත්මියට හිමිවිය යුතු උසස්වීම මේ වන විට ලබාදී ඇති බවත්, ඒ නිසා ඇයට අසාධාරණයක් වී නොමැති බවත් ය.

- ඒ අනුව ඇයට හිමි හිඟ වැටුප් ගෙවා ඇති අතර, අතිකාල දීමනා ලෙස ගෙවා ඇති මුදල් සමග ගණනය කිරීමෙන් පසු වැඩිපුර ගෙවා ඇති මුදල් ඇයගෙන් අයකරගෙන ද ඇත. (2013.07.15 දින සටහන් පිටු අංක 10)

- එසේ 2009.12.01 දිනට පෙරදාතම් කර තමාට උසස්වීම ලැබුණත් තමාට සිදුවූ අසාධාරණය ඒ මගින් සම්පූර්ණයෙන් අවසන් නොවූ බව කියා සිටින සඳසීලි මහත්මිය එම උසස්කිරීම 2003.10.28 දින සිට බලපැවැත්වෙන සේ පෙරදාතම් කොට හිඟ වටුප්, දීමනා ආදිය ලබාදෙන ලෙස දිගින් දිගට ම ඉල්ලා සිටී.

- දෙවන පාර්ශ්වය මතු කරන තවත් එක් වැදගත් ස්ථාවරයක් වන්නේ බේරුම්කරණය වෙත කර ඇති යොමුවේ කාල වකවානුවක් සඳහන් කොට නොමැති අතර අදාළ උසස්වීම 2009.12.01 දින සිට ලබා දී ඇති නිසා ඇයට මෙහි නඩු නිමිත්තක් නැති බවයි.

පළමුවැනි පාර්ශ්වයේ නීතිඥ මහතා ඉතා ඕනෑකමින් එම කාරණය ඉදිරිපත් කළත් කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ දී සඳසීලි මහත්මිය දිගින් දිගට ම ඉල්ලා සිට ඇත්තේ ඇයට එකී උසස්වීම 2003.12.01 දිනට පෙරදාතම්කර දෙන ලෙසයි. ඒ බව කම්කරු දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සාක්ෂි වලිනුත්, සාක්ෂි මෙහෙයවීම් වලදීත් තහවුරු විය.

## නිගමනයන්

සාක්ෂි මෙහෙයවීම, ලේඛන ඉදිරිපත් කිරීම, දෙපාර්ශ්වයේ ලිඛිත සැලකිරීම් ඇතුළු නඩුවේ සමස්ත පටිපාටිය අධ්‍යයනය කිරීමෙන් පසු ව කරන ලද ඉහත සඳහන් නිරීක්ෂණ ඇසුරෙන් පහත නිගමනයන්ට එළඹෙමි.

1. පළමුවැනි පාර්ශ්වය වන එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණිකේ හේරත් මහත්මියට ඇය 2003.10.28 දින පැවති සම්මුඛ පරීක්ෂණයෙන් A 7 ශ්‍රේණියේ විධායක සහකාර (ලේඛක) තනතුරට උසස්වීම ලබානොදීමෙන් අසාධාරණයක් සිදු වූ බව,

2. එම අසාධාරණය ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් සිදු වූවත් 2003.10.13 දිනැති අංක : 1310/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාර ව බිහිකරන ලද, අද වන විට ඇයට සහනයක් ලබා ගත හැකි එක ම ස්ථානය වන ලංකා පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය විසින් සඳසීලි මහත්මියට එකී උසස්වීම ලබාදීමෙන් ඇයට සිදු වී ඇති අසාධාරණය ඉවත් කළ යුතු බව,

3. 2003.10.28 දින සිට 2009.09.30 දක්වා කාලයට ඇයට ඒ ඒ කාලයට හිමි හිඟ වැටුප් සහ අනෙකුත් දීමනා ආදිය ලබා දිය යුතු බව,

4 2003.10.28 දින සිට 2009.09.30 දක්වා කාලය තුළ විධායක නොවන නිලධාරිනියක ලෙස උපයා ඇති අතිකාල ආදිය ආයතනය විසින් අයකර ගත යුතු බව.

**ප්‍රදානය**

1. පළමුවැනි පාර්ශ්වය වන එච්. එම්. ජේ. ආර්. සඳසීලි මැණිකේ හේරත් මහත්මියට 2003.10.28 දින සිට බලපැවැත්වෙන සේ A 7 ශ්‍රේණියේ විධායක සහකාර (ලේඛක) තනතුරට පෙරදාතම කිරීම.
2. ඇයට 2003.10.28 දිස සිට 2009.09.30 දක්වා කාලයට තනතුරට හිමි හිඟ වැටුප් සහ අනෙකුත් දීමනා ආදිය ගණනය කොට ගෙවීම.
3. 2003.10.28 දින සිට 2009.09.30 දක්වා කාලයට ඇයට විධායක නොවන ශ්‍රේණියක නිලධාරිනියක ලෙස ගෙවා ඇති අතිකාල ආදී දීමනා ආයතනය විසින් ආපසු අයකර ගැනීම.

4 නඩු ගාස්තු හෝ නඩුවට අදාළ වෙනත් කිසිදු වියදමක් එක් පාර්ශවයකින් තවත් පාර්ශවයකට හිමි නොවීම.

5. මෙකී ප්‍රදානයන් ඒවා අඩංගු ගැසට් පත්‍රය පළ වී මාසයක කාලයක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය.
6. එකී ප්‍රදානයන්ට අදාල මුදල් මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයෙහි තැන්පත් කල යුතු ය.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2014.02.20 දින කාර්මික අධිකරණයේ දී ය.

05 - 710